


# සාලේ ගිණි මොළවන යේමනය

දශක දෙකක් දිග් විජය කොට සිටි සිය විජිතය ගිණි මොළවනු වස්, සාලේ ඉකුත් 18 වන දින යළි යේමනයට පැමිණියේය. ඒ සා දීර්ඝ කාලයක් අභියෝගයකින් තොරව පවත්වාගෙන ආ ව්‍යවස්ථාපිත ඒකාධිපති පාලනයට තිත තබන ලෙස රටවැසියන්ගෙන් එල්ල වූ බලපෑමට යටත්ව, මාස කීපයකට පෙර පසු පසට තැබූ පය නැවත ඉදිරියට තබමින් සාලේ මෙවර ජනතාවට අනතුරු ඇඟවීමක් ද කළේය. සිය විරුද්ධවාදීන්ට මැතිවරණ සඳහා ඉදිරිපත්වීමට ඉඩ ලැබෙන්නේ නම් තමා ජනාධිපති ධුරයෙන් ඉවත්නොවන බවද තමන්ට එරෙහි විරෝධතා අවසන් නොකළහොත් රට සිවිල් යුද්ධයක් කරා ගමන් කරනු ඇතිබවද හෙතෙම පැවසීය. එයට ප්‍රතිචාර දක්වමින් විරෝධතාකරුවන් කියා සිටියේ සාලේ සමග කිසියම් හෝ ආකාරයක එකගතාවක් ඇති කරගැනීමට තමන් සූදානම් නැති බවත් ඔහු ධුරයෙන් ඉවත්වන තෙක් ජන අරගලය පෙරට ගෙන යන බවත්ය. ඒත් සමගම යේමනයේ ආරක්ෂක අංශ සහ විරෝධතාකරුවන් අතර ගැටුම් ඇති වුණ අතර හමුදාව සිදු කළ වෙඩි තැබීම්වලින් සියයකට ආසන්න විරෝධතාකරුවන් පිරිසක් ජීවිතක්ෂයට පත්වූහ.

යේමනය දැන් පවතින්නේ මීට මාස කීපයකට පෙර ලිබියාව පැවති තත්ත්වය හා සමාන තත්ත්වයකය. යේමන ජනාධිපති අලි අබ්දුල්ලා සාලේ අද රඟදක්වමින් සිටින්නේ එදා ලිබියා ජනාධිපති මුහම්මර් ගඩාෆි රඟදැක්වූ භූමිකාවමය.

මේ වසර ආරම්භයේ අරාබි දේශපාලන ලෝකය හරහා හමා ගිය ජනතා කුණාටුවලට ගොදුරු වූ රටවල් අතරට යේමනයද අයත්ය. ජනාධිපති සාලේට එරෙහිව යේමනයේ ජනතාව වීදි බසින්නට පටන්ගත්තේ ජනවාරි 29 දිනය. කලාපයේ සෙසු ඒකාධිපති පාලකයන් මෙන්ම සාලේ කළේ ද තමන්ට එරෙහිව වීදි බට ජනතාවට හමුදාව යොදවා වෙඩි තැබීමයි. දෙපාර්ශ්වය අතර ගැටුම්වලින් යේමනයේ ප්‍රධාන නගරවල මළ සිරුරු සහ සුන්බුන් ගොඩගැසෙද්දී එක් පාර්ශ්වයක් හෝ අඩියක් පස්සට ගන්නට සූදානම් නොවීය. සංහිඳියාවක් සඳහා සාලේ සහ විරෝධතාකරුවන් අතර මූලික අවබෝධතා ගිවිසුමක් ඇතිකිරීමට ඇමරිකාව ප්‍රමුඛ රටවල් කීපයක් උත්සාහ කළේය. ගල්ෆ් සහයෝගීතා කවුන්සිලය මැදිහත්ව ඒ සඳහා වන ගිවිසුමක් කෙටුම්පත් කොට දෙපාර්ශ්වයට ඉදිරිපත් කළේය.

එයට අනුව ගිවිසුම අස්සන් කළ දින සිට මාසයක් ඇතුළත සිය ධුරයේ රාජකාරි ආවරණය උප ජනාධිපතිවරයාට පවරමින් සාලේ ජනාධිපති ධුරයෙන් ඉවත්විය යුතු විය. එතැන් සිට දින 60 ඇතුළත නව ජනාධිපතිවරයෙක් තෝරාපත්කර ගැනීම සඳහා ජනාධිපතිවරණයක් පැවැත්විය යුතුය. අග්‍රාමාත්‍යවරයා සහ විපක්ෂයේ කණ්ඩායමක් විසින් එකී කාලයේ පාලන කටයුතු ගෙන යා යුතුය. ධුරය අතහරින සාලේ ජනාධිපතිවරයාට එරෙහිව කිසිදු ක්‍රියා මාර්ගයක් නොගන්නා බවටද ගිවිසුම මගින් සහතික කොට තිබිණ.

මැයි 22 දින ගිවිසුම අස්සන් කිරීමට යොදාගෙන තිබිණ. තමන්ට කලින් වෙනත් ස්ථානයකදී විරෝධතාකරුවන් එයට අස්සන් තැබීම යන කාරණය මුල් කරගනිමින් සාලේ ගිවිසුමට අස්සන් තැබීම අවසන් මොහොතේ ප්‍රතික්ශේප කළේය. ඒ හේතුවෙන් රැවුලයි කැදයි දෙකම බේරාගැනීමට ගල්ෆ් සහයෝගීතා කවුන්සිලය ගත් උත්සාහය ව්‍යර්ථ වූ අතර නැවතත් විරෝධතාකරුවන් සහ ආරක්ෂක අංශ අතර ගැටුම් උග්‍ර වන්නට පටන්ගත්තේය. එහි ප්‍රතිඵලයක් ලෙස ජුනි 03 දා විරෝධතාකරුවන් එල්ල කළ ප්‍රහාරයකින්

ශ්‍රීලාල් සෙනෙවිරත්න

ජනාධිපති සාලේ ද තුවාල ලැබීය. සිය රාජකාරි ආවරණය උප ජනාධිපතිවරයාට පැවරූ සාලේ ප්‍රතිකාර සඳහා සෞදි අරාබියට ගියේය. එහිදී ඔහු කියා සිටියේ සහයෝගීතා කවුන්සිලය ගෙනා අවබෝධතා ගිවිසුම තවදුරටත් අධ්‍යනය කළ යුතුව ඇති බවය. මාස තුනකට අධික කාලයක් සෞදි අරාබියේ සිට සාලේ යළි ඉකුත් මස 18 යේමනයට පැමිණියේ 2013 දී සිය ධුර කාලය අවසන් වන තෙක් ධුරයෙන් ඉවත් නොවන බව කියන පරන තැටිය නැවත වාදනය කරමින්ය. ඒත් සමගම විරෝධතාකරුවන් දහස් ගණනින් යළි වීදි බසින්නට වූ අතර ඔවුන්ට වෙඩි තබන ලෙස සාලේ හමුදාවට අණ දුන්නේය. 20 දා එල්ල කළ හමුදා ප්‍රහාරවලින් විරෝධතාකරුවන් 56 ක් ජීවිතක්ෂයට පත්ව තවත් සිය ගණනක් තුවාල ලැබුවේය. 27දා යේමන ආරක්ෂක ඇමැති මොහමඩ් නසාර් ගමන් ගත් රිය පෙළට මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල කෙරුණු අතර ඇමැතිවරයාගේ දිවි බේරුණේ අනූනවයෙනි.

ලිබියාව හා ගඩාෆි සමග ගත්විට යේමනය සහ සාලේ හිමිකම් කියන්නේ වඩා දුබල තත්ත්වයකටය. අරාබි ලෝකයේ ඇති අව සංවර්ධිත දුප්පත්ම රටක් ලෙස යේමනය සැළකේ. සෞදි අරාබිය, රතු මුහුද හා ඕමානයෙන් වටකොට ගත් වර්ග කිලෝ මීටර් පන්ලක්ෂ පනස්පන් දහසක භූමි භාගයකින් සමන්විත යේමනයේ ප්‍රධාන ආදායම් මාර්ගය ඛනිජ තෙල්ය. එහෙත් යේමනය සතුව ඇති ඛනිජ තෙල් සම්පත බෙහෙවින් සීමා සහිතය. 2017 වන විට එය මුළුමනින්ම අවසන් වනු ඇති බවට ගණන් බලා තිබේ. මිලියන 24 ක් වන එරට ජනගහනයෙන් 65%ක් රැකියා වියුක්තියෙන් පෙළෙන අතර රාජ්‍ය අංශය දූෂණයෙන් පිරී ඇති බව කියයි. සාලේට එරෙහිව ජනතාව වීදි බසින්නට පටන්ගත්තේ එම තත්ත්වයන්ට සාලේ වගකිව යුතු බව කියමින් සහ මෑතකදී ගෙනා ව්‍යවස්ථා සංශෝධනයන්ට විරුද්ධවය.

සාලේ ප්‍රථම වරට මහජන ඡන්දයෙන් යේමන ජනාධිපති ධුරයට පත්වන්නේ 1999 දීය. ඒ වන විට ඔහුට රට තුළ තිබූ ජනතා ප්‍රසාදය කොතෙක්ද යත් මැතිවරණයේදී ඔහු ජය ගත්තේ 96.2%ක ඡන්ද ප්‍රතිශතයක් හිමිකර ගනිමිනි. එතෙක් ඔහු රටේ පාලකයා බවට පත්ව සිටියේ සෘජුවම මහජන ඡන්දයෙන් නොවේ.

1942 මාර්තු 21 වන දින උපන් සාලේ 1958 වසරේ යේමන හමුදාවට බැඳී හමුදා ඇකඩමියේ දෙවසරක පුහුණුවෙන් පසු ක්‍රෝප්රල්වරයකු ලෙස සේවයට එක්විය. 1963 වසරේදී දෙවැනි ලුතිතන් තනතුරේ අධිකාරියට පත්කරනු ලැබූ සාලේට 77 දී එවක යේමන ජනාධිපති අහමඩ් හුසේන් විසින් ප්‍රාන්ත හමුදා පාලක තනතුරක් පිරිනැමුවේය. ජනපති හුසෙන් ඝාතනයට ලක්වීමෙන් පසු සාලේ යේමනයේ ජනාධිපති හා හමුදා නායකයා බවට පත්විය. මුලින් උතුරු සහ දකුණු යනුවෙන් රටවල් දෙකක් ලෙස පැවැති යේමනය ජනරජයක් ලෙස නම් කොට එක් රටක් බවට පත් වුණ අවස්ථාවේ ජනාධිපති ධුරය සඳහා තෝරා ගැණුනේද සාලේ ය. 93 වසරේ පැවැති මහ මැතිවරණයෙන් සාලේ නායකත්වය දුන් පක්ෂය ජය ගැනීමෙන් පසු නව පාර්ලිමේන්තුව 94 වසරේදී ඔහුට හමුදාවේ ඉහළම නිලයක් වන ෆීල්ඩ් මාර්ෂල් නිලය පිරිනැමුවේය. එලෙස ජනප්‍රසාදයේ හිණි පෙත්තටම නැගගත් සාලේ 99 වසරේ ජනාධිපතිවරණයෙන් ලත් විශිෂ්ඨ ජයග්‍රහණයෙන් පසු වහාම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනවිත් ජනාධිපති සහ පාර්ලිමේන්තුවේ ධුර කාලය වැඩි කරගත්තේය. ජනාධිපති ධුර කාලය වසර පහ සිට හත දක්වා ද පාර්ලිමේන්තුවේ ධුර කාලය වසර හතර සිට හය දක්වාද ඉහළ දැමුණි.

තමන් විසින්ම දීර්ඝ කරගත් ජනාධිපති ධුර කාලයේ ප්‍රථම වසර හත නිමවීමෙන් පසු නැවත ජනාධිපති ධුරයට තරග නොකර එම අවස්ථාව තරුණ පරපුරට ලබාදෙන බව 2005 සිය පදවි ප්‍රාප්ති උළෙලේදී පැවසූ සාලේ 2006 ජනාධිපතිවරණයට ඉදිරිපත්ව එයින්ද ජයගත්තේය. ඒ අනුව ඔහුගේ ධුර කාලය ඉදිරියට තවත් දෙවසරක් පවතී.

අරාබිකරයේ දීර්ඝ කාලීන ඒකාධිපති පාලනයන් පවත්නා රටවල ජනතාව එම පාලනයනට එරෙහිව වීදි බසින්නට පටන්ගත්තේ පසුගිය වසරේ අවසාන කාලයේය. එදා මෙදා තුර සිදුවූ හැම ජනතා සටනක්ම ජනතාවට ජය අත්කර දෙමින් අවසන් වූයේය. එහෙත් ඒ සඳහා එකී රටවැසියන් විසින් ගෙවිය යුතු වූ මිල බෙහෙවින් අධිකය. එහි උපරිමය වාර්තා කළේ ලිබියාවයි. ටියුනීසියාව, තුර්කිය, මෙන් නොව ලිබියාව ජනතා සටන ජයග්‍රහණය වෙනුවෙන් විශාල දේපොළ සහ ජීවිත සංඛ්‍යාවක් පරදුවට තැබුවේය. ඒ ලිබියා නායක ගඩාෆි විසින් දැරූ මැරෙන තෙක් සටන් කරනු මිස බලය අත්නොහරින්නේ ය යන මතය හේතුවෙනි. එසේ බල කාමයෙන් මත්ව සිය බලය රැකගැනීම පිණිස රටවැසියන් මතට ගුවනින් බෝම්බ හෙලන්නට පවා පසුබට නොවූ ගඩාෆි ආ ගිය තැනක් හොයා ගැනීමටද අද නොහැකිය.

ගඩාෆිගේ ඉරණම පවා දැක දැක දැන් සාලේ සැරසෙන්නේද ගඩාෆි මෙන්ම යන යකා කොරහත් බිදගෙන යාමට බව පෙනේ. ගඩාෆි කලකදී ලිබියාවේ වීරයාය. අසහාය නායකයාය. එහෙත් ඒ හැමදාටම යැයි ගඩාෆි සිතුවේය. තමන් පමණක් නොව තමන්ගෙන් පසු කිරුළ තම පුතාට පළඳවන්නටද සැළසුම් සැදුවේය. එහෙත් අවසානයේ ඒ සියල්ල සිහින බවට පත්විය. ගඩාෆිගේ ඉරණම සාලේ ද ඇතුළුව ගඩාෆි මග යන්නන් කොයි කවුරුන් විසිනුත් සිහිකට යුතුය. ....

## දින පොත

01 ගරිල්ලා යුද්ධයක් අරඹමින් සෑම නිවෙසකම සෑම ගමකම යුද ගිනි අවුළුවන බව ලිබියාවේ හිටපු නායක කර්නල් මුවම්මර් ගඩාෆි සිරියානු රූපවාහිනී නාලිකාවකට පවසයි. ලිබියාවේ පාලනය සියතට ගත් කැරලිකාර කණ්ඩායම විසින් ගඩාෆිට යටත්වන ලෙස කළ නිවේදයකට ප්‍රතිචාර දක්වමින් ඔහු වැඩිදුරටත් පවසා තිබුණේ තමන් කිසිවිටෙකත් යටත්වීමට හෝ රට හැර යාමට සූදානම් නැති බවත් දීර්ඝ කාලින ගරිල්ලා යුද්ධයකට සූදානම් බවත්ය.

11. ගඩාෆිගේ බාල පුතු අල් සාදි දේශපාලන රැකවරණ පතා සිය රටට පැමිණ සිටින බව නයිගර් රාජ්‍ය නිවේදනයකින් කියයි.

,12. ඉදිරි දින 10 ඇතුළත ලිබියාවේ නව රජයක් පිහිටුවන බව ලිබියා අන්තර්වාර පාලන මණ්ඩලයේ නායක ජිබ්රාල් ට්‍රිපොලි නුවරදී ජාතිය අමතමින් ප්‍රකාශ කරයි. පිහිටුවීමට නියමිත නව රජයේ අගමැතිවරයා බවට පත්වීමට නියමිත හේ ගඩාෆි රජයේ හිටපු අධිකරණ ඇමැතිවරයෙකි.

,2011 විශ්ව රූ රැජින ලෙස ඇන්ගෝලාවේ ලෙයිලා ලොපේක් (25) පත්වෙයි. බ්‍රසීලයේ සාවෝ පාවුලෝ නුවරදී මෙවර පවත්වනු ලැබුවේ 60 වන විශ්ව රූ රැජින තරගයයි.

13. ඇෆ්ගනිස්ථානයේ කාබුල් අගනුවර ඇමරිකා තානාපති කාර්යාලය සහ නේටෝ මූලස්ථානයට තලේබාන් සටන්කාමීන්ගෙන් පැය 19 ක් එක දිගට එල්ල වූ දරුණු ප්‍රහාරයකින් අඩුතරමින් 15 දෙනෙකුවත් ජීවිතක්ෂයට පත්වූ බව වාර්තාවේ.

15. ලිබියාවේ හිටපු නායක ගඩාෆි උපන් ප්‍රදේශය වන 'සාර්තේ' කැරලිකරුවන් විසින් අත්පත් කරගනු ලබයි. එහෙත් ගඩාෆි ගැන කිසිදු හෝඩුවාවක් නොලැබේ.

16. අල්-ක්වයිදා සංවිධානයේ පාකිස්ථාන් මෙහෙයුම් ප්‍රධානී අබු හෆාස් අල් ෂහීර් වසිරිස්ථානයේ සැගව සිටියදී නියමුවන් රහිත ඩ්‍රෝන යානා යොදාගෙන එල්ල කළ මිසයිල ප්‍රහාරයකින් මරා දැමුණු බව ඇමරිකාව පවසයි.

17. ඩෙන්මාර්කයේ ප්‍රථම කාන්තා අගමැති ලෙස හේල් තෝරිං ෂිමිඩ් පත්වෙයි.

18. නේපාලය ටිබැටය සහ ඉන්දියාවේ සිකිම් ප්‍රාන්තයට බලපෑ ප්‍රබල භූමිකම්පාවකින් 53 දෙනෙකු ජීවිතක්ෂයට පත්වෙති.

20. ඇෆ්ගනිස්ථානයේ හිටපු ජනාධිපතිවරයකු (1992-1996) මෙන්ම එරට සාම කවුන්සිලයේ සභාපති බහනුද්දීන් රබානි (71) මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකින් ජීවිතක්ෂයට පත්වෙයි.

22. යුරෝපා සංගමය ප්‍රමුඛ රටවල් 29 ක් එක්ව ත්‍රස්තවාදයට එරෙහිව ක්‍රියාකිරීමට 'ගෝලීය ත්‍රස්ත මර්ධන සංවිධානය' නමින් නව සංවිධානයක් පිහිටුවාගනියි.

25. සෞදි අරාබියේ කාන්තාවන්ට ඡන්ද බලය සහ මැතිවරණවලට ඉදිරිපත්වීමේ අයිතිය ලබාදෙන බව එරට පාලක අබ්දුල්ලා රජු නිවේදනය කරයි. රාජාණ්ඩු පාලනයක් පවතින සෞදි අරාබියේ නගර සභා මැතිවරණ පමණක් පැවැත්වෙන අතර මීළග නගර සභා මැතිවරණය පැවැත්වීමට නියමිතව ඇත්තේ 2011 වසරේදීය.

26. ෆැසිපික් සාගරය හරහා පැමිණ පැයට කිලෝමීටර 170 ක වේගයෙන් පිලිපීනය හරහා හමා ගිය 'නෙසැට්' සුළි කුණාටුවෙන් ජල ගැලීම්වලින් මැනිලා අගනුවර ඇතුළු පෙදෙස් රැසක් ජලයෙන් යටවී ලක්ෂයක් පමණ අවතැන්ව හත්දෙනෙකු ජීවිතක්ෂයට පත්වෙති.

, සන්නද්ධ කල්ලිවලට සහ හමුදාවලට ළමා සොල්දාදුවන් බඳවා ගැනීම තහනම් කිරීමේ එක්සත් ජාතීන්ගේ සම්මුතියට ඇන්ගෝලාව, ආමේනියාව, බොස්නියාව, කොස්ටාරිකා සහ සැන් මැරිනා යන රටවල් ද අස්සන් තබයි. එක්සත් ජාතීන්ගේ 66 වන වාර්ෂික සමුළුව පැවැත්වෙන අතර සිදුකෙරුණු එම අස්සන් කිරීම් සමග එම සම්මුතියට අස්සන් කළ රටවල් සංඛ්‍යාව 100 දක්වා ඉහළ යයි.

, ලිබියාවේ ට්‍රිපොලි අගනුවර අබු සලීම් බන්ධනාගාරය ආසන්නයේ පිහිටි සමූහ මිනී වලකින් මළ සිරුරු 1700 ක් සොයාගත් බව එරට බලය අල්ලාගත් කැරලිකාර කණ්ඩායම පවසයි. එම සිරුරු 1996 වසරේ හිටපු ජනපති ගඩාෆිට එරෙහිව වීදි බැසීම නිසා අත්අඩංගුවට පත් විරෝධතාකරුවන් පිරිසකගේ බවද ඔවුහු පවසති.